**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**

**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**

**OFFICE ON MISSING PERSONS**

# ඇබෑර්තු

- අතුරුහදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කාර්තව්‍ය ඉටුකිරීම) පනත මගින් පිහිටුවන ලද ආයතනයකි.
- අතුරුහදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මුදල් හා ප්‍රසම්පාදන අංශ ප්‍රධානී (තනතුරු 01) HM 1-1

** රැකියාවේ ස්වභාවය:** මුදල් හා ප්‍රසම්පාදන අංශයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම මෙන්ම, අදාළ මුදල් හා ප්‍රසම්පාදන ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පද්ධතීන් සංවර්ධනය කිරීම සහ සියලුම මුදල් හා ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**සුදුසුකම් :** (පහත 1 හෝ 2 අනුව)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ / කළමනාකරණය (මූල්‍ය) යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරට අදාළ වෙනත් උපාධියක් **සහිතව** අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 13 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

    **හෝ**

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 13 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

    **වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

    **වැටුප් පරිමාණය :** රු. 140,640 – 15x 4,100 – 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

    වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ප්‍රධානී (තනතුරු 01) HM 1-1

**රැකියාවේ ස්වභාවය :** නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම්වලට අදාළ නීතිමය කාර්යභාර සම්බන්ධ කටයුතුවලට සහාය වීම. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිමය, ප්‍රතිපත්තිමය සහ පර්යේෂණමය මැදිහත්වීම් සිදු කිරීම සඳහා නීතිමය අභියෝගවලට විසඳුම් සෙවීම සහ අභියෝග සඳහා උපදෙස් දීම හා උපායමාර්ගික සැලසුම් සැකසීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් හෝ නීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලබා තිබීම **සමඟ** නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක,

GOVERNMENTJOB.LK

ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 12 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** රු. 140,640 – 15x 4,100 – 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## වින්දිත සහ පවුල් සහාය ප්‍රධානී (තනතුරු 01) HM 1-1

**රැකියාවේ ස්වභාවය :** වින්දිත සහ පවුල් සහාය ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සහ අදාළ උපායමාර්ගික ක්‍රියාපටිපාටි සකස් කිරීම. තවද, විශේෂඥයන් වෙත යොමු කිරීමේ පද්ධතියක් සකස් කර සංවර්ධනය කිරීම මෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මනෝ-සමාජයීය සහාය සහ ප්‍රජා සේවා කටයුතු සඳහා උපායමාර්ගික සැලසුම්කරණය සහ සමාලෝචන කටයුතු මෙහෙයවීම සහ ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝවිද්‍යාව / උපදේශනය සහ මනෝවිද්‍යාව / දර්ශනය සහ මනෝවිද්‍යාව / සමාජ විද්‍යාව / සාමය සහ ගැටුම් නිරාකරණය යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් **සහිතව** අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම **සහ** රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" වසර 12 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** රු. 140,640 – 15x 4,100 – 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## සන්නිවේදන සහ ප්‍රචාරණ ප්‍රධානී (තනතුරු 01) HM 1-1

**තනතුරු සාරාංශය:** සන්නිවේදන සහ ප්‍රචාරණ ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍ය ඔස්සේ සන්නිවේදන උපාය මාර්ග සකස් කිරීම සහ සංවර්ධනය කිරීම. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලුම ව්‍යාපෘති ප්‍රචාරණ සහ සන්නිවේදන කටයුතු සඳහා නායකත්වය ලබා දීම.

**සුදුසුකම්:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සන්නිවේදනය හෝ ජන මාධ්‍ය පිළිබඳ උපාධියක් **සමඟ** අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම. තවද, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ මට්ටමේ' අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද.

**වයස:** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ ස්ථිර තනතුරුවල දැනටමත් නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප:** රු. 140,640 – 15x 4,100 – 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 ට අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් අදාළ ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## රැකවරණ අංශ ප්‍රධානී (තනතුරු 01) HM 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රාදේශීය කාර්යාලවල රැකවරණ ඒකක අධීක්ෂණය කිරීමේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන විධිමත් ක්‍රියා පටිපාටි සහ ප්‍රායෝගික ක්‍රමවේදයන් ඇතුළුව, ඔවුන්ගේ රැකවරණය වෙනුවෙන් අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන වගකීම වේ.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් **නීතිය / සාමය සහ ගැටුම් නිරාකරණය / දේශපාලන විද්‍යාව හෝ සමාජ විද්‍යාව** පිළිබඳ උපාධියක් ලබා තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයකින් හෝ **මානව හිමිකම්** පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. තවද, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ මට්ටමේ' අවම වශයෙන් වසර 12ක පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ ස්ථිර තනතුරුවල දැනටමත් නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** රු. 140,640 – 15x 4,100 – 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ අනෙකුත් ආයතනික දීමනා සඳහා හිමිකම් ඇත.

## මුදල් හා ප්‍රසම්පාදන නියෝජ්‍ය/ සහකාර ප්‍රධානී (තනතුරු 01) MM 1-1

**රැකියාවේ ස්වභාවය :** ආයතනයේ පද්ධති නඩත්තු කිරීම, සියලුම මූල්‍ය ගනුදෙනු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මුදල් හා පරිපාලන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම මෙහි ප්‍රධාන වගකීම වේ.

**සුදුසුකම්** : (පහත දැක්වෙන 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය හෝ වාණිජ පිළිබඳ උපාධියක් **සහ** උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් **වසරක (01)** පළපුරුද්ද.

හෝ

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (CIMA / ACCA / ICA) අතරමැදි විභාගය සමත් වී තිබීම **හෝ** CMA පූර්ණ සුදුසුකම ලබා තිබීම **සහ** අවම වශයෙන් **වසරක (01)** පළපුරුද්ද.

හෝ

3. ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් **වසරක (01)** පළපුරුද්ද.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

GOVERNMENTJOB.LK

## පරිපාලන නියෝජ්‍ය/සහකාර ප්‍රධානී (තනතුරු 01) MM 1-1

**රැකියාවේ ස්වභාවය :** පරිපාලන කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම සහ මානව සම්පත් හා පරිපාලනයට අදාළ සියලු කරුණුවලදී විධායක අධ්‍යක්ෂවරයා, මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ සන්නිවේදනය පවත්වා ගැනීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය / පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව).

## ප්‍රාදේශීය සම්බන්ධීකාරක (ප්‍රධාන) (තනතුරු 02) MM 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම ඇතුළුව, ප්‍රාදේශීය කාර්යාලයේ සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සහ නිරීක්ෂණය කිරීම ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය / මානව හිමිකම් / කළමනාකරණය / පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය හෝ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම **සහ** පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

## පරිපාලන නිලධාරී (තනතුරු 01) JM 1-1

**රැකියාවේ ස්වභාවය :** මානව සම්පත් හා පරිපාලන අංශයේ කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම, සියලුම පරිපාලන කටයුතු නියෝජ්‍ය පරිපාලන ප්‍රධානී සහ සහකාර පරිපාලන ප්‍රධානී සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අනෙකුත් දෙපාර්තමේන්තු හා අංශ සමඟ පරිපාලන ගැටලු සම්බන්ධ සන්නිවේදන කටයුතු සඳහා වගකීම දැරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය / පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** රු. 72,650 – 10x 1,360 – 18x 2,040 – 122,970/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

GOVERNMENTJOB.LK

## තොරතුරු තාක්ෂණ නිලධාරී (තනතුරු 02) JM 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අදාළ අංශයේ කාර්යයන්හි රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :** (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ හෝ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   **හෝ**

2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **හෝ**

3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** සුදුසුකම් ලැබීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (5) සේවා පළපුරුද්දක් තිබීම.

   **හෝ**

4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** සුදුසුකම් ලැබීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) සේවා පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය .

**වැටුප් පරිමාණය :** රු. 72,650 – 10x 1,360 – 18x 2,040 – 122,970/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

## වින්දිත සහ පවුල් සහාය නිලධාරී (තනතුරු 08) JM 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ සහ අතුරුදන් කරනු ලැබූ තැනැත්තන්ගේ පවුල් වෙත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මගින් සපයනු ලබන සියලුම සහයෝගීතා සහ සේවාවන්හිදී වින්දිතයා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන් සහතික කිරීම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී පරිසරයක් ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම ඇතුළුව, වින්දිත සහ පවුල් සහයෝගතා අංශයේ කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව හිමිකම් / මනෝවිද්‍යාව / උපදේශනය සහ මනෝවිද්‍යාව / සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

GOVERNMENTJOB.LK

**වැටුප් පරිමාණය:** රු. 72,650 – 10x 1,360 – 18x 2,040 – 122,970/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

## දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු (තනතුරු 06) MA 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත කළමනාකරණ අංශයේ කාර්යයන්ට අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :**

අ) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම සහ පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබීම:

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

ආඅ (.පො.ස ) විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විභාගයෙන් (උසස් පෙළ)03) සමත්ව තිබීම.

ඇපරිගණක පුහුණුව හෝ දත්ත ඇතුළත් කිරීම පිළිබඳ සහතිකයක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ( .ලැබේ

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 46,220 – 10x 540 – 7x 630 – 4x 890 – 20x 1,190 – 83,390/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

## කළමනාකරණ සහකාර (තනතුරු 13) MA 1-1

**රැකියාවේ ස්වභාවය :** බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ අදාළ අංශයේ කාර්යයන් සහ ක්‍රියාකාරකම්වලට අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සහ ආයතනයේ කළමනාකරණ, පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, සහාය වීම සහ අනුපූරක දායකත්වය ලබා දීම.

**සුදුසුකම් :**

අ) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම සහ පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබීම:

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

ආ.අ (පො.ස ) විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විභාගයෙන් (උසස් පෙළ)03) සමත්ව තිබීම.

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 46,220 – 10x 540 – 7x 630 – 4x 890 – 20x 1,190 – 83,390/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

GOVERNMENTJOB.LK

## රියදුරු (තනතුරු 02) PL 3

**රැකියාවේ ස්වභාවය :** ආයතනයේ පරිපාලන සහ විධායක ශ්‍රේණිවල නිලධාරීන්ගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ වාහනය නඩත්තු කිරීම, ධාවන සටහන් යාවත්කාලීන කිරීම සහ අදාළ කාර්යයන් හා ක්‍රියාකාරකම්වලට අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :** අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාර දෙකකට (02) නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) සමත්ව තිබීම **සහ** මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රිය පැදවීමේ පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 43,280 – 10x 490 – 10x 540 – 10x 590 – 12x 630 – 67,040/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

## කාර්යාල කාර්යය සහයක (තනතුරු 04) PL 1

**රැකියාවේ ස්වභාවය:** අංශයේ කාර්යයන් සඳහා සහාය වීම, අංශ ප්‍රධානියා විසින් පවරනු ලබන කාර්යයන් භාර ගැනීම සහ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ අදාළ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම. එමෙන්ම ආයතනයේ කළමනාකරණ, පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, සහාය වීම සහ අනුපූරක දායකත්වය ලබා දීම.

**සුදුසුකම් :** අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාර දෙකකට (02) නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 40,500 – 10x 450 – 10x 490 – 7x 540 – 15x 590 – 62,530/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

**ඉහත සියලුම පුරප්පාඩු සඳහා අදාළ වන කරුණු:**

- **සෑම අයදුම්කරුවෙක්ම:**
  - ✓ ශ්‍රී ලංකාකික පුරවැසියෙකු විය යුතුය.
  - ✓ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
  - ✓ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
  - ✓ යහපත් චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.
- පරිගණක සාක්ෂරතාවය සහ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මනා දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- අවශ්‍ය තොරතුරු **ඇතුළත් නොකර** ඉදිරිපත් කරනු ලබන ඕනෑම අයදුම්පතක් **ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- අයදුම් කරන තනතුර, අයදුම්පතේ සහ අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය.

GOVERNMENTJOB.LK

- අයදුම්කරුවන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලබා දී ඇති අයදුම්පත් ආකෘතිය/ මාදිලි නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.
- තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
- කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ OMP මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.
- මෙම තනතුරු ස්ථිර වන අතර සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලබා දෙයි.
- බඳවා ගැනීම් සම්බන්ධ අවසන් තීරණය OMP මණ්ඩලය සතු වන අතර, බඳවා ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඕනෑම තීරණයක් ගැනීමේ අයිතිය මණ්ඩලය සතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමඟ **2026 ජනවාරි මස 25** වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය:
**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය.**

**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**